**ශීර්ෂය 316 - වයඹ පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

**1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

සෞභාග්‍යමත් වයඹ ජනතාවක්.

**1.2 මෙහෙවර**

වයඹ ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම පිණිස මානව, මුල්‍ය හා භෞතික සම්පත් කාර්යක්ෂමව මනා ඵලදායීව හැසිරවීමට නායකත්වය දීම.

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

වයඹ පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 25,898.49 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 25,250.93 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 647.56 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 2.5 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2017 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 21,866.19 | 21,866.19 | - | - |
| මූලධන | 4,032.30 | 3,384.74 | 647.56 | 16 |
| **එකතුව** | **25,898.49** | **25,250.93** | **647.56** | **2.5** |

**3. විගණන නිරීක්ෂණය**

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදු කර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.